# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2183/35 – 2020 ජූලි 09 වැනි බ්‍රහස්පතින්දා – 2020.07.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/04/2019/44.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එස්. ජී. නාවලඇල්ල මයා, අංක 131/22, විජේසේකර මාවත, මුදුන්ගොඩ, ගම්පහ

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලූමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලොට් 15, බ්ලොක් " A ", බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,


1A – G 32459 – 26(2020/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453 F, වී. ජයරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 මාර්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/2019/44.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

එම්. එස්. ජී. නාවලඇල්ල මයා, අංක 131/22, විජේසේකර මාවත, මුදුන්ගොඩ, ගම්පහ

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, ලොට් 15, බ්ලොක් " A ", බියගම අපනයන සැකසුම් කලාපය, වල්ගම, මල්වාන.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

"ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් ආයතනයේ සේවය කරන ලද එම්. එස්. ජී. නාවලඇල්ල මහතාට පත්වීම් ලිපියේ සඳහන් පරිදි පහත සඳහන් දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනය කවරේද?" යන්න පිළිබඳව වේ.

1. 2014.09.15 සිට 2015.12.31 දක්වා හා 2016 අප්‍රේල් සහ මැයි මාස සඳහා වාහන දීමනාව.
2. 2014.09.15 දින සිට 2016.05.31 දක්වා රියදුරු දීමනාව.
3. 2015 අගෝස්තු සිට 2015 දෙසැම්බර් දක්වා හා 2016 අප්‍රේල්, මැයි මාස සඳහා ඉන්ධන දීමනාව.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 දෙසැම්බර් මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 624

මගේ අංකය : IR/22/04/2010.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

**4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.09.17 වැනි දින අංක 2089/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.08.29 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර පවත්නා 2018.08.16 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එල්. ආර්. සුමතිපාල මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.08.29 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 - 625/1

---

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බදුල්ල, සිල්වර්ලෑන්ඩ්, හිඟුරුගමුව පාර, ''සෞම්‍යා'' අංක 417, ඩී. එම්. කරුණාරත්න මයා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/22/04/2010.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩී. ජී. විජේරත්න මයා, අංක 187/2, තොටුපලවත්ත, අලවතුගොඩ

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, අංක 20, වෝඩ් පෙදෙස, කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ මාණ්ඩලික සහකාර (පොත් තබන්නා) තනතුරෙහි සේවයේ යොදවා සිටි ඩී. ජී. විජේරත්න මහතාට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබාදුන් සහකාර අභ්‍යන්තර විගණක තනතුරට උසස් කිරීම 2008.02.05 දිනට පෙරදතම කරනමෙන් හා එකී තනතුර සහකාර මූල්‍යාධිකාරී වශයෙන් සංශෝධනය කර ඒ අනුව අදල හිඟ වැටුප් හා වෙනත් දීමනා ලබාදෙන ලෙසට ඔහු විසින් කරන ලද ඉල්ලීම යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත වන්නේ නම් ඩී. ජී. විජේරත්න මහතාට ලැබිය යුතු සහනයන් මොනවාද යන්න පිළිබඳව වේ.''

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 31 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 625/2

මගේ අංකය : IR/COM/02/2016/162.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.07.13 වැනි දින අංක 2079/75 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2018.07.09 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. පියතිලක මයා, අංක 199, තක්ෂිලා උයන, මුනගම, හොරණ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර පවත්නා 2018.07.04 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එස්.කාරියවසම් මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2018.07.09 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 - 626/1

---

මගේ අංකය: IR/COM/02/2016/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. පියතිලක මයා, අංක 14, ප්‍රයිඩ් ඔෆ් සවුත්, (කේට්වින් ලිට්ල් හවුස්)යටියන පාර, කැකණදුර, මාතර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, මත්තේගොඩ, මද්‍රා උයන, අංක 149/102, කේ. කේ. කුමාරි ධනපාල මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2016/162.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

කේ. පියතිලක මයා, අංක 14, ප්‍රයිඩ් ඔෆ් සවුත්, (කේට්වින් ලිට්ල් හවුස්)යටියන පාර, කැකණදුර, මාතර.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, අංක 25, ගෝල්ෆේස් ටෙරස්, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''කේ. පියතිලක මහතා රාජ්‍ය මැණික් සංස්ථාවේ කණිෂ්ඨ ලිපිකරුවෙකු ලෙස සේවයට බැඳී ජ්‍යෙෂ්ඨ ලිපිකරු සහ වැඩබලන ව්‍යාපෘති නිලධාරී ලෙස උසස්වීම් ලැබ සිටි අවස්ථාවකදී රාජ්‍ය මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට, එම අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත අන්තර්ග්‍රහණය වී අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් පසුව විශ්‍රාම යාමට ඉල්ලීමක් කර මාසයක් අවසන් වීමට පෙර එම ඉල්ලීම ඉවත් කර ගන්නා බවට අධිකාරියට දන්වා තිබියදී එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර සේවය අවසන් කිරීමෙන් අසාධාරණයක් සිදුවී ඇත් ද? යන්න හා එසේ නම් ඔහුට ලැබිය යුතු සහනයන් කවරේද'' යන්නත් පිළිබඳව වේ.

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 පෙබරවාරි මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 626/2

මගේ අංකය : CI/175/2004.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4 (1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ 2018.04.06 වැනි දින අංක 2065/48 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.04.02 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. චෙව්රෝන් ලූබ්‍රිකන්ට්ස් ලංකා පී.එල්.සී, (පැරණි නාමය - කැල්ටෙක්ස් ලූබ්‍රිකන්ට්ස් ලංකා ලිමිටඩ්), තැ.පෙ. 06, කොලොන්නාව.
2. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක 114/ඒ, පහළ බියන්විල, කඩවත.

අතර පවත්නා 2018.03.16 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් පී. මහාදේව මහතා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දැන් පෙනී යන හෙයින් නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2017.04.02 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

07 - 627/1

---

*මගේ අංකය*: CI/175/2004.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කරුණු පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. වෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී, (පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්), තැ.පෙ. 06, කොලොන්නාව

සහ

2. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක 114/ඒ, පහල බියන්විල, කඩවත.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/F , වී. ජයරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**දිනේෂ් ගුණවර්ධන,**
නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා
කම්කරු සබඳතා අමාත්‍ය.

2020 අප්‍රේල් මස 03 වැනි දින,
කොළඹ දී ය.

*මගේ අංකය*: CI/175/2004.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශ්වයක් වශයෙන්,

අන්තර් සමාගම් සේවක සංගමය, අංක 259/9, සෙත්සිරි මාවත, කොස්වත්ත, තලංගම.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

1. වෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී, (පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්), තැ.පෙ. 06, කොලොන්නාව.

සහ

2. එන්. එච්. ඒ. සෝමපාල මහතා, අංක 114/ඒ, පහල බියන්විල, කඩවත.

**ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''වෙව්රෝන් ලුබ්රිකන්ට්ස් ලංකා පී.එල්.සී, (පැරණි නාමය - කැල්ටෙක්ස් ලුබ්රිකන්ට්ස් ලංකා ලිමිටඩ්) හි සේවය කළ පහත නම් සඳහන් සේවකයින් සිව් (04) දෙනා එන්. එච්. ඒ. සෝමපාල යන අයගේ සේවකයන් බව පවසමින් ඔහු මගින් ඔවුන්ගේ සේවය අවසන් කිරීම සාධාරණ හා යුක්ති සහගත වන්නේද? එසේ නොවන්නේ නම් ඔවුන්ට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ'' .

1. ටී. මර්වින් පෙරේරා මයා
2. කේ. ඒ. සමන්ත මයා
3. එච්. ඩබ්. ගුණපාල මයා
4. ආර්. එම්. ඩබ්ලිව්. යූ. බණ්ඩාර මයා

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

07 - 627/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.